**ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශය**

-----------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

ආරක්ෂක අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 21 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

**---------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(අ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

**1.6.1 තැන්පතු**

----------

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත කාලපරිච්ඡේදය තුල තැන්පතු ලැබීම් සහ තැන්පතු ගෙවීම් ශේෂ පිළිබඳව අමාත්‍යාංශ පොත් අනුව දැක්වෙන ශේෂය හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව (**SA** 30) දැක්වෙන ශේෂය අතර වෙනස අක් මුදල් ගැළපුම් ගිණුමට මාරු කල යුතු විය. එසේ වුවද විගණනයේදී සිදුකළ ගණනය කිරීම් අනුව එසේ මාරු කල යුතු අගයන් සහ අක් මුදල් ගැලපුම් ගිණුමට මාරු කර තිබුණු අගයන් අතර රු.32,628,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | ලැබීම් ගෙවීම් සමස්ථ වටිනාකම් වෙනස අවස්ථා දෙකේදීම සමාන අගයක් ගන්නා බැවින් අක් මුදල් ගැලපුම් ගිණුමට සමස්ථ බලපෑමක් නැත. | නිවැරදි අගයන් මත ගැලපුම් ගිණුම පිලියෙල කල යුතුය. |
| (ආ) | විගණනයට ඉදිරිපත්කල තොරතුරු අනුව 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් කාර්යන් 79 කට අදාලව රු.470,693,653 ක් කොන්ත්‍රාත් රැඳවුම් මුදලක් පැවැති අතර එයින් රු.231,094,300 ක් වර්ෂ දෙකකට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පැවැතුණි. තවද ඒ තුල රු.88,382,691 කට අදාල කොන්ත්‍රාත් 12 ක කාර්යන් අවසන්වී තිබුණු නමුත් ඉන් රු. 48,362,756 ක් 2021 මාර්තු 31 දින වනවිටත් නිරවුල් වී නොතිබුණි. තවද, මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව එම ඉදිකිරීම් සම්බන්ධ අඩුපාඩු හඳුනාගෙන අයකරගැනිමට හෝ එසේ නොමැතිනම් රැඳවුම් මුදල් නිදහස් කිරිමට කටයුතුකර නොතිබුණි. | ආරක්ෂක හමුදා මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියට දැනට ක්‍රියාත්මක වෙමින් පවතින බැවින් එම රැඳවුම් මුදල් නිදහස් කිරීමට සුදුසුකම් ලබා අනුමැතිය ලැබුණු පසු නිදහස් කල හැක. | මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කල යුතුය. |

## 1.6.2 දේපල පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව දැක්වෙන සමාලෝචිත වර්ෂයේ වත්කම් අත්පත් කර ගැනිම් අගය රු. 4,405,767,203 ක් වුවත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6 ආකෘතිය) එම අගය රු.28,299,595 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.4,377,467,608 ක වෙනසක් නිරූපනය විය. | 2020 වර්ෂයේ ඇතැම් මිලදී ගැනීම් ආරම්භක ශේෂ ලෙස ඇතුළත් වීම හා 2021 වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීම, පවත්නා ගොඩනැගිලි වෙනුවෙන් කල මිලදී ගැනීම් මාර්ගගත ක්‍රමය යටතේ ඇතුලත් කිරීමට පහසුකම් නොවීම, ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් වත්කම් CIGAS වැඩසටහන හරහා ගිණුම්ගත කර නොතිබීම, හඳුනාගත් වත්කම් 2020 වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ගිණුම්ගත කිරීම හා අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන ලබාදී ඇතත් ත්‍රිවිධ හමුදාවලට අයත් වත්කම් බැවින් අමාත්‍යාංශයේ වත්කම් ලෙස ගිණුම් ගත කළ නොහැකිවීම ආදිය මේ සඳහා හේතුවී ඇත. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව දැක්වෙන වත්කම් අත්පත් කර ගැනිම අගය හා උපලේඛණ අනුව දැක්වෙන එම අගයන් සමාන විය යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව 2019 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් අවසන් ශේෂය රු. 9,143,240,909 ක් වූ අතර 2020 මූල්‍ය ප්‍රකාශන අනුව 2020 ජනවාරි 01 දිනට පැවති ආරම්භක ශේෂය රු.27,480,074,788 ලෙස දක්වා තිබුණි. ඒ අනුව ශේෂය ඉදිරියට ගෙන ඒමේදී රු.18,336,833,879 ක ශේෂයේ වැඩිවීමක් නිරීක්ෂණය විය. පූර්ව වර්ෂවල සිදුවූ වැරදි නිවැරදි කිරීම හා සමාලෝචිත වර්ෂයේදී වෙනත් රාජ්‍ය අමාත්‍යාංශ වෙත වත්කම් මාරුකිරීම පිළිබඳ ගනුදෙනු ආරම්භක ශේෂයට ගැලපීමෙන් මෙම වෙනස ඇතිවී තිබුණි. | 2020 වර්ෂය තුල මෙම අමාත්‍යාංශයෙන් ඉවත්වූ අංශයන්ට අයත් ස්ථාවර වත්කම් ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉවත් කිරීම සහ අමාත්‍යාංශයට අයත් වත්කම් වල ආරම්භක ශේෂයන් නිවැරදි කිරීම මෙම වෙනසට හේතු වී ඇත. | ආරම්භක ශේෂය නිවැරදි විය යුතු අතර ආරම්භක ශේෂයට කරන ලද ගැලපීම් අනාවරණය කළ යුතුය. |

### 1.6.3 සීමා ඉක්මවීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක 10301 දරණ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම සඳහා පනවා තිබූ උපරිම වියදම් සීමාව රු. 38,500,000 ක් වුවද තත්‍ය වියදම රු. 58,908,903 ක් වූයෙන් උපරිම වියදම් සීමාව ඉක්මවා රු.20,408,903 ක වියදමක් දරා තිබුණු බව නිරීක්ෂණය විය. මෙම සීමා සංශෝධනය සඳහා භාණ්ඩාගාරය වෙතින් ඉල්ලීමක් සිදුකර තිබුණු නමුත් 2021 මාර්තු 03 දින වන විටත් ඒ සඳහා වන අනුමැතිය ලැබී තිබුණ බව අනාවරණය නොවුණි. | සීමා සංශෝධනය සඳහා අනුමැතිය ඉල්ලා 2021.05.12 වන දින න්‍යාය පුස්තකයට ඇතුළත් කර ඇතිබව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වාචිකව දන්වා ඇත.<br>ඒ අනුව සීමා සංශෝධනය සඳහා වන අනුමැතිය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම මුදල් අමාත්‍යාංශයෙන් සිදු කල යුතු බව තව දුරටත් කාරුණිකව දන්වා සිටිමි. | අත්තිකාරම් සීමාවන් පිලිපැදිය යුතුයි. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මුදල් රෙගුලාසි 454(1) ප්‍රකාරව පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ බඩු ලේඛණ පොතක් (Inventory Book) පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර හා රාජ්‍ය බුද්ධි සේවයේ යාපනය- මණ්ඩල අංක 4 හි ලෙජරය තුලනය කරද නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 454(1) හි විධිවිධාන ප්‍රකාරව 44 වැනි පොදු ආකෘතිය පරිදි බඩු ලේඛන පොතක් යාවත්කාලින කර පවත්වා ගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |

### 1.6.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්**,** එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්**,** එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂය සිට ඉදිරියට නිසි පරිදි ඉදිරිපත් කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදුකර තිබුණු එක්සත් ජාතීගේ සාම සාධක මෙහෙයුම් කාර්යයන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ අදායම එක්සත් ජනපද ඩොලර් 24,082,696 ක් වූ අතර මෙම හිඟහිටි අදායමින් එක්සත් ජනපද ඩොලර් 13,024,132 ක් වර්ෂ 01 සිට 04 දක්වා කාල පරාසයක පැවතුණි. | ප්‍රමාද වී ඇති දීමනා අයකර ගැනීම සඳහා එක්සත් ජාතින්ගේ නිත්‍ය නියෝජිත කාර්යාලය විසින් අදාල අංශ දැනුවත් කර ඇත. ආරක්ෂක අමාත්‍යාංශය මඟින් පසු විපරම් හා අධීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ. | හිඟ ආදායම් නිසි පරිදි අයකරගැනීමට කටයුතු කිරීම හා ඒ සම්බන්ධ පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2020 වර්ෂයේදී රු.මිලියන 1,740 ක ආදායමක් ලබාගැනීමට පුරෝකථකය කලද සමාලෝචිත වර්ෂය තුළ රැස්කර තිබූ ආදායම රු.මිලියන 121.79 ක් පමණක් විය. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 7 ක් වැනි පහල මට්ටමක පැවතුණි. තවද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තුවක් ඉදිරිපත්කර නොතිබූ බැවින් ආදායම් අයකර ගැනීමේ කාර්යක්ෂමතාවය ගණනය කල නොහැකිවිය. | පැවති වසංගත තත්ත්වය සාමසාධක මෙහෙයුම් සඳහා ගෙවීම් ප්‍රමාද වීමට බලපා ඇත. එසේ වුවත් හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය හරහා එක්සත් ජාතින්ගේ සංවිධානය දැනුවත් කිරීමට කටයුතු යොදා ඇත. 2021 වර්ෂයේ සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අදායම් ඇස්තමේන්තු රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | - එම - |
| (ඇ) | මුදල් රෙගුලාසි 85(1), 85(2) හා අංක 01/2015 හා 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව ආදායම් ප්‍රක්ෂේපණ සහ පුරෝකථනය කිරීම සඳහා ආදායම් ඇස්තමේන්තු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කල යුතුබව අවධාරණය කර ඇතත්, අමාත්‍යාංශය විසින් 2020 වර්ෂය සඳහා ඉදිරිපත්කර තිබූ ආදායම් සංකේතාංක 20.03.06.00 - එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් ආදායම් ඇස්තමේන්තුව තුල ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ආදායම් ඇස්තමේන්තුව ඇතුළත්කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අදාල ආදායම් ඇස්තමේන්තු රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ වලට අනුව කටයුතු කල යුතුය. |
| (ඈ) | 01/2015 හා 2015.07.20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ (05) ඡේදය හා මුදල් රෙගුලාසි 128 (2) (එ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය අවස්ථාවන්හී ආර්ථික තත්වයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නොයෙකුත් සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු කාලානුරූපීව | 1996 අංක 22 දරණ ගිනි අවි පනතෙහි සංශෝධන සඳහා කෙටුම්පත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ගාස්තු සංශෝධනයට කටයුතුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංශෝධනය කලයුතු වුවත් 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන තුවක්කු බලපත්‍ර ගාස්තු කාලීනව සංශෝධනය කර නොතිබුණි. | | |
| (ඉ) | හිඟ අදායම් වාර්තා අනුව පුපුරණ ද්‍රව්‍ය හා තුවක්කු බලපත්‍ර ගාස්තු හා අනෙකුත් ගාස්තු සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 31 දිනට හිඟ අදායම රු. 421,890 ක් විය. මෙම හිග ආදායම කාලීනව අයකර ගැනීමට සතුටුදායක පියවර ගෙන නොතිබුණි. | ගිණි අවි හිමිකරුවන් විදේශගත වීම, මිය යෑම, ව්‍යාපාරය අත් හැරීම, ගිණි අවි පැවරීම පිළිබඳව දැනුවත් නොකිරීම, නඩු භාණ්ඩ ලෙස ගිනි අවි පැවතීම, ඇදිරි නීතිය හා සංචරණ සීමා පනවා තිබීම ආදිය මේ සඳහා හේතුවී ඇත. | හිඟ ආදායම් නිසි පරිදි අයකරගැනීමට කටයුතු කිරීම හා ඒ සම්බන්ධ පසුවිපරම් කටයුතු අඛණ්ඩව කල යුතුය. |

**2.2** **වියදම් කළමනාකරණය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------------- | --------------- |
| (අ) | පුනරාවර්ථන වැය විෂයන් **07** කට සලසා තිබුණු එකතු වටිනාකම රු. 2,430,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි. | අමාත්‍ය කාර්යය මණ්ඩලය සඳහා වියදම ඇස්තමේන්තුගත කලද ආරක්ෂක අමාත්‍ය තනතුර ගරු ජනාධිපතිතුමා දැරීම නිසා වියදම් උපයෝජනය නොවීම. | මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිලියෙල කලයුතුය. |
| (ආ) | වැය විෂයයන් තුනක් සඳහා සලසා තිබුණු රු.6,476,000 ක ප්‍රතිපාදනය මෙන් සිව් ගුණයකට අධික ප්‍රතිපාදන හෙවත් රු. 26,025,465 ක් මු.රෙ. 66 යටතේ එම වැය විෂයයන්ට මාරු කර ගෙන තිබුණු අතර එසේ මාරු කිරීමෙන් අනතුරුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 48 ක් හෙවත් රු. 15,503,187 ක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. | අතුරු සම්මත ගිණුම මගින් වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් මු.රෙ. 66 යටතේ අමතරව ප්‍රතිපාදන මාරු කිරීමට සිදු වීම හා ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මෙයට හේතු විය. | ප්‍රතිපාදන මාරු කිරීමේදී නිසි කළමනාකරණයකින් යුතුව සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූලධන වැය විෂයන් 09 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන එකතුව රු. 27,575,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරිවී පැවතුනි. තවද, මූලධන වැය විෂයයන් 07කට සලසා තිබුණු එකතුව රු.17,067,690 ක ප්‍රතිපාදනද, පුනරාවර්තන වැය විෂයයන් 7 කට සලසා තිබුණු එකතුව රු. 21,161,878 ක ප්‍රතිපාදනද ඉතිරිවී පැවතිණි. එම ඉතිරිවීම් වෙන්කරන ලද ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ත් සියයට 99 ත් අතර පරාසයක පැවැතුනි. | අමාත්‍ය කාර්ය මණ්ඩලය අමාත්‍යාංශය තුල ස්ථාපිත නොවීම සහ කොවිඩ් වසංගතය හේතුවෙන් අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම ආදිය මෙයට හේතු විය. | අවශ්‍යතා නිසිලෙස හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කලයුතුය. |
| (ඇ) | රු. 10,504,800 ක ප්‍රතිපාදන සලසා තිබුණු මූලධන වැය විෂයන් 03 ක් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොපැවැතීම හා අත්‍යවශ්‍ය වියදම් දැරීම යනාදී හේතු දක්වමින් මු.රෙ. 66 යටතේ රු.11,761,800 ක ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණු නමුත් එසේ මාරු කරගත් සම්පූර්ණ ප්‍රතිපාදනයද ඇතුළුව රු. 13,719,362 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | අමාත්‍ය කාර්ය මණ්ඩලය අමාත්‍යාංශය තුල ස්ථාපිත නොවීම කොවිඩ් වසංගත තත්වය නිසා ප්‍රසම්පාදන කටයුතු අඩාල වීම, විදේශීය ගමන් සීමා වීම, ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු ප්‍රමාද වීම වැනි හේතතු නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | - එම - |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------------- | ------------------------------- | ------------------- |
| (අ) | ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන සටහන් අංක **(iii)** හා **(iv)** අනුව 2020 දෙසැම්බර් 31 දිනට පැවති බැඳීම් හා බැරකම් වල එකතු වටිනාකම රු.573,999,564 ක් වූ අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව දැක්වෙන බැඳීම් හා බැරකම් ප්‍රමාණය රු. 629,436,279 ක් විය. ඒ අනුව රු. 55,436,715 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙය ඉදිරියේදී අවධානයට ලක් කිරීමට සටහන් කර ගන්නා ලදී. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමග සැසඳීම් කර නිවැරදි වටිනාකම් දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 94 අනුව වාර්ෂික ඇස්තමේන්තු වල මුදල් ප්‍රතිපාදන සලසා ඇත්නම් විනා වැඩක්, සේවාවක් සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු වේ. එසේම 2017 අප්‍රේල් 22 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදය අනුව යම් මුදල් වර්ෂයකට අදාළ සියලුම බැරකම් එම වර්ෂය තුලදී මුදල් ගෙවා නිදහස් කල යුතු අතර කිසිදු බැරකමක් ඊළඟ මුදල් වර්ෂය තුල නිරවුල් කිරීමේ අරමුණ ඇතුව ඉදිරියට ගෙන නොයා යුතු වේ. එසේ වුවද අමාත්‍යාංශය විසින් වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයන් 17කට අදාළව රු. 47,991,066 ක බැරකම් වලට බැඳී තිබෙන බව නිරීක්ෂණය විය. | අතුරු සම්මත ගිණුම් 04 ක් යටතේ සැලසූ ප්‍රතිපාදනවල සංශෝධන සිදුකිරීම සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පුනරාවර්තන වියදම් ඉහළ යාම මෙම තත්ත්වය ඇති වී ඇත. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේ ජනවාරි මස ගෙවීම් වවුචර් පිළිබඳ නියැදි පරීක්ෂණයේදී 2020 වර්ෂයට අදාළ අවස්ථා 13 කදී එකතුව රු.3,742,387 ක් වූ වියදම් 2021 වර්ෂයේ ප්‍රතිපාදන වලින් වැය කර තිබුණු නමුත් එම වියදම් 2020 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් මුල්‍ය ප්‍රකාශනවල රු. 3,742,393 ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී බැරකම් ප්‍රකාශනය සඳහා පසුගිය වර්ෂයට අදාළ සියලුම ගෙවීම් ඇතුලත් කිරීමට සටහන් තබා ගන්නා ලදී. | බැරකම් නිසි ලෙස හඳුනාගෙන මුල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 751 (1) | ජාතික ශිෂ්‍යභට බලකායේ මන්නාරම, කුරුණෑගල, හා පුත්තලම කඳවුරු 03 ක වාහන 03ක් බඩු ලේඛණ පොතේ සටහන් කර නොතිබුණි. | නිරීක්ෂණයන් පිළිබඳව අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/RED/2015/8/පොදු(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 01. | ස්ථාන මාරුවී ගොස් ඇති, මියගිය සහ විශ්‍රාම ගිය, වැඩ තහනම් කර ඇති, සේවය හැර ගිය සහ වෙනත් නිලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. 5,136,145 ක් වූ අතර එම ණය ශේෂය තුල ඇතුළත් වසර 5කට වැඩි ණය ශේෂය රු.2,751,519 ක් විය. මෙම කල්ගතවූ ණයශේෂ සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම ණය ශේෂ වසර 20 වැඩි කාලයක් හිඟහිටි ණය මුදල් වන අතර අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අඛන්ඩව ක්‍රියාත්මක වේ. | චක්‍රලේඛ වලට අනුව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ඇස්තමේන්තු අනුව අමාත්‍යාංශය යටතේ වන ආදායම් සංකේතාංක දෙකක් ආශ්‍රිතව රු. මිලියන 1,820 ක වාර්ෂික ආදායමක් ලබාගැනීම ඇස්තමේන්තු කර ඇතත් පූර්වෝක්ත රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මෙම ආදායම් එකතු කිරීමේ කාලවකවානු හා ඊට අනුරූප කාර්යසාධන මට්ටම් දක්වමින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට අන්තර්ගත කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ආදායම් එකතු කිරීමේ විස්තර 2021 ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගත කර ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | පූර්වෝක්ත චක්‍රලේඛය පරිදි පිළියෙල කරනු ලබන වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලසුමක් අන්තර්ගත කළ යුතු වුවත් එසේ ඇතුළත්කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් කර නොමැති වුවද අතුරු සම්මත ගිණුම් මගින් අක් මුදල් සැලසුම් පිළියෙළ කර මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර අක් මුදල් ලබා ගැනීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛය පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලසුමක් අන්තර්ගත කළ යුතුය. |
| (ඇ) | පූර්වෝක්ත රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට ඇතුළත්කල යුතු අභ්‍යන්තර විගණන සැලැස්ම, අදාල වර්ෂයට යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුවහය, අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල විස්තර ආදිය වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට ඇතුළත්කර නොතිබුණි. | **2021** වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩල විස්තර ඇතුලත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලසුම පිළියෙළ කල යුතුය. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආරක්ෂක හමුදා මුලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය | | |
| **i.** ආරක්ෂක හමුදා මුලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය ඉදිකිරීම් අදියර දෙකක් යටතේ සැලසුම් කර තිබූ අතර ඉදිකිරීම් අදියර 01 යටතේ සමාලෝචිත වර්ෂය තුළ නිමකිරීමට සැලසුම්කළ අංක 08 දරන ගොඩනැගිල්ල, සන්නිවේදන ගොඩනැගිල්ල සහ ආරක්ෂක ගොඩනැගිල්ල යන ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු සැලසුම්කල ඉලක්කයන්ට නිමකිරීමේ ප්‍රමාදයක් නිරීක්ෂණය විය. තවද ඉදිකිරීම් අදියර 01 යටතේ වන ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණය, සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල, ජල ප්‍රවාහන පද්ධතිය සහ ජල පොම්පාගාරයේ ඉදිකිරීම් යටතේ ප්‍රධාන කාර්යන් 96 ක් හදුනාගෙන තිබුණු අතර ඉන් කාර්යන් 31 ක් 2020 වර්ෂය තුල කිසිදු භෞතික ප්‍රගතියක් අත්කරගෙන නොමැති බව නිරීක්ෂණය විය. | විවිධ හේතූන් නිසා මන්දගාමීව සිදු වූ ඉදිකිරීම් කටයුතු බහුතරයක් මේ වන විට අවසන් අදියරේ පවතී. එසේම කොවිඩ් 19 වසංගතය හේතුවෙන් බාධා සිදු වී ඇතත් ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු කරනු ලැබේ. | සැලසුම්කල පරිදි අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟා විය යුතු වීම හා කොන්ත්‍රාත් සුපරීක්ෂණය සහ අධීක්ෂණය නිසි ලෙස ක්‍රියාත්මක කරමින් ගිවිසගත් කාලය තුල කොන්ත්‍රාත් නිමකල යුතු වීම. |
| **ii.** ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන **10,008.62** ක් උපයෝජනය කරමින් ප්‍රමුඛතා අදියර **08** ක් යටතේ කොන්ත්‍රාත් කාර්යයන් **25** ක් සහ බාහිර කොන්ත්‍රාත් කාර්යයන් **356** ක් ක්‍රියාත්මක | ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කොන්ත්‍රාත් සියයට 57.92ක සාමාන්‍ය ප්‍රගතියක් ලඟාකරගෙන ඇත. වෙන්වූ ප්‍රතිපාදන මත අංක 08 හා යුධ හමුදා මූලස්ථානය ගොඩනැගිලි සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඇත. ප්‍රමුඛතා අධියර 5 ක කොන්ත්‍රාත් සැලකිය යුතු ප්‍රමාණයක් | සැලසුම්කල පරිදි කොන්ත්‍රාත් කාර්යයන් ක්‍රියාත්මක කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට සැලැසුම්කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුලදී කාර්යයන් **146** ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | ක්‍රියාත්මක කල නොහැකි වූ අතර 2021 දී සිදුකෙරේ. | |
| **iii.** | කින්හදෙණිය අදියර **01** ට අදාලව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව රු.මිලියන **349.24** ක ඉදිකිරීම් ඇස්තමේන්තුකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපාදනය ලෙස රු.මිලියන **191.45** ක් පමණක් ලැබී තිබුණි. එහෙත් එම ප්‍රතිපාදනයෙන් **2020** දෙසැම්බර් **31** දිනට උපයෝජනය කර තිබුණේ රු.මිලියන **70.97** ක් පමණක් බැවින් එම කාර්යයෙහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට **37** ක් හා සියයට **14** ක් වැනි අවම මට්ටමක පැවතුණි. | වසංගත තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් සේවක ප්‍රමාණය අඩු කිරීමට සිදුවීම, භාණ්ඩ සපයා ගැනීමේදී සිදුවූ දුර්වලතා ,බැඳුම් ඇපකර ප්‍රමාදවීම්, ප්‍රසම්පාදන ප්‍රමාදයන් හා ආනයන ප්‍රමාදවීම් යනාදී කරුණු මේ සඳහා හේතුවිය. | ප්‍රතිපාදනය උපයෝජනය කර මූල්‍ය හා භෞතික ප්‍රගතිය අපේක්ෂිත පරිදි අත්කරගත යුතුය. |
| (ආ) | උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය<br>----------------------------------------<br>ආරක්ෂක සේවාවන් අතර පොදු සන්නිවේදන යාන්ත්‍රණයක් ඇති කරවීම සඳහා ක්‍රියාත්මක කර තිබුණු උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය වර්ෂ 2014 - 2016 දක්වා කාලය තුල අවසන් කිරීමට සැලසුම් කර තිබුණු අතර 2019 නොවැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණි. 2020 ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.මිලියන 882.75 ක් උපයෝජනය කර සන්නිවේදන කුලුණු ඉදි කිරීම, මයික්‍රෝ තරංග ගුවන් විදුලි ප්‍රතියෝජක පද්ධති ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීම, අකුරේගොඩ දක්වා ප්‍රකාශ තන්තු ඇදීම සහ කොළඹ නගර ආරක්ෂක | ටෙන්ඩරය අවලංගු වීම නැවත ප්‍රසම්පාදන කටයුතු කිරීම සඳහා 2022.12.31 දක්වා ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කර ගැනීමේ කැබිනට් පත්‍රිකාව සඳහා අනුමැතිය ලැබී ඇත. ශබ්ද වාරක විදුලි උත්පාදක යන්ත්‍ර 22 ක් උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල පද්ධතියේ ස්ථාන 21 ක ස්ථාන ගත කොට ඇති අතර කුටි ඉදිකිරීමද 2020.12.31 දිනට නිම කොට ඇත. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කල යුතුය |

සන්නිවේදන ජාලය සම්පූර්ණයෙන් නිම කිරිමට සැලසුම් කළද මෙම ඉදිකිරීමට අදාල ප්‍රසම්පාදන ප්‍රමාදයන් හේතුවෙන් තවදුරටත් ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණි. එම නිසා ව්‍යාපෘතියේ අරමුණු කාලීනව ඉටුකරගත නොහැකිව තිබුණි. තවද ඉදිකිරීම් නිමකර ඇති කුළුණු , උපාංග මැදිරි හා 2016 හා 2017 වර්ෂයන් හිදී මිලදීගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 22 ඇතුළු උපකරණ අදාල අරමුණු සදහා උපයෝගී කර ගැනීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවැතිණි.

## 3.3 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| ඉදිකිරීම් ප්‍රමාදය, ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රමාදවීම ආදී කරුණු නිසා අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවීම හේතුවෙන් කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝකර තිබුණු කොන්ත්‍රාත් කාර්යන් 07 ක් විය. ඒවාට අදාල සැපයුම් පස් දෙනෙකු ඉදිරිපත් කළ රු.1,008,548,800 ක හා ඇමරිකන් ඩොලර් 4,445,076 ක කාලය දීර්ඝ කිරිමේ හිමිකම් පෑම් **(Claims for EOT)** 24 ක් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අතර ඉන් කොන්ත්‍රාත් කරුවන් දෙදෙනකු වෙත රු.8,640,502 ක් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රමාණයන්ගේ නිවැරදිතාවය උපදේශණ සේවා ආයතනයේ ද නිර්දේශ හා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත ගෙවා ඇත.<br>හිමිකම් පෑම්වල නිවැරදිතාවය පරීක්ෂාකර නිර්දේශ උපදේශණ ආයතනය වෙත ඉදිරිපත් කර ඇත. | අනවශ්‍ය ප්‍රමාදයන් හේතුවෙන් ඇතිවන අතිරේක හිමිකම්පෑම් අවමකර ගැනීමත් අනාර්ථික වියදම් අවමකරගත යුතුය. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 මාර්තු 16 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/3/201 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා දත්ත පද්ධතියක් ඇති කර ඉලක්ක කරා ලගාවීම් පිළිබද නිවැරදි වාර්තාකරණයක් සිදුකර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්කයන් කරා ලඟා විම නිශ්චිත දත්ත පද්ධතියක් ආශ්‍රයෙන් මැන බලා නිවැරදි වාර්තාකරණයක් සිදු කිරීම සඳහා අවශ්‍ය පියවර ඉදිරියේදී ගනු ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන ඉලක්කයන්ට ළඟාවීම අරමුණු කර ගනිමින් කටයුතු කළ යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත මුළු කාර්ය මණ්ඩලය 481 න් තනතුරු 74 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. ඉන් පුරප්පාඩු 13 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. | පුරප්පාඩු ඉදිරියේදී සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් පවත්වාගත යුතුය. |